# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2389/09 - 2024 ජුනි මස 18 වැනි අඟහරුවාදා - 2024.06.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**දකුණු පළාතේ පළාත් සභාව**

මාතර ප්‍රාදේශීය සභාව

**විනෝද බදු පැනවීම**

*1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි*

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතින් ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුළත්වීමේ ගාස්තුවෙන් 10%ක විනෝද බද්දක් පනවා අය කිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මාතර ප්‍රාදේශීය සභාව විසින් 2023.08.08 දින තීරණ පොතේ තීරණ අංක 2023/08/08/03 යටතේ ගනු ලැබූ තීරණය දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විලී ගමගේ වන මම 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) අනුව මා වෙත පැරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ආචාර්ය **විලියම් විජේසිංහ ගමගේ,**
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2024 ජනවාරි මස 26 වැනි දින,
ගාල්ල ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

*තීරණය*

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මාතර ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට කරනු ලබන ගෙවීමකින් 10% (සියයට දහයක) ට සමාන මුදලක් බද්දක්



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වශයෙන් පනවා අයකළ යුතු යැයි ද, මෙම තීරණය 2023.09.01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද තීරණය කරමි. එසේම ඉහත පනවන ලද විනෝද බද්ද එකී කාර්යය පවත්වන දිනට පෙර අදාළ සංවිධායක හෝ සංවිධායකවරු විසින් නිසි ලෙස මාතර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් තීරණය කරමි.

EOG 06 - 0135/1

---

**දකුණු පළාතේ පළාත් සභාව**

වැලිගම ප්‍රාදේශීය සභාව

**විනෝද බදු පැනවීම**

***1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි***

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය සභාව විසින් 2023 ඔක්තෝබර් මස 30 දින තීරණ අංක 2023/10/30/01 යටතේ ගෙන ඇති පහත තීරණය 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (2) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව දකුණු පළාත් ආණ්ඩුකාරවර ආචාර්ය විලියම් විජේසිංහ ගමගේ වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් කාරුණිකව නිවේදනය කරනු ලැබේ.

ආචාර්ය **විලියම් විජේසිංහ ගමගේ,**
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2023 දෙසැම්බර් මස 29 වැනි දින,
ගාල්ල ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

*තීරණය*

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව වැලිගම ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන, එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් සියයට දහය (10%)කට සමාන මුදලක් බද්දක් වශයෙන් පනවා අයකළ යුතු යැයි ද, මෙම යෝජනා සම්මතය *ගැසට් පත්‍රයේ* පළකරන ලද මාසයට ඉක්බිතිවම එළඹෙන මාසයේ පළමුවන දින සිට ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 ඔක්තෝබර් මස 30 දින තීරණ අංක 2023/10/30/01 යටතේ තීරණය කරමි.

EOG 06 - 0135/2

---

**දකුණු පළාතේ පළාත් සභාව**

පිටබැද්දර ප්‍රාදේශීය සභාව

**විනෝද බදු පැනවීම**

***1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි***

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතින් ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුළත්වීමේ ගාස්තුවෙන් 10%ක විනෝද බද්දක් පනවා අය කිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව පිටබැද්දර ප්‍රාදේශීය සභාව විසින් 2022.12.20 දින මහා සභා තීරණ අංක IX

යටතේ සම්මත කර ඇති යෝජනාව, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විලියම් විජේසිංහ ගමගේ වන මම 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ආචාර්ය **විලියම් විජේසිංහ ගමගේ,**
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2023 දෙසැම්බර් මස 29 වැනි දින,
ගාල්ල ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

*යෝජනාව*

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට කරනු ලබන ගෙවීමකින් 10% (සියයට දහයක) ට සමාන මුදලක් බද්දක් වශයෙන් පනවා අයකළ යුතු යැයි ද, මෙම යෝජනාව 2023.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතු යැයිද යෝජනා කරන්නීය. එසේම ඉහත පනවන ලද විනෝද බද්ද එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර අදාළ සංවිධායක හෝ සංවිධායකවරු විසින් නිසි ලෙස පිටබැද්දර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් පිටබැද්දර ප්‍රාදේශීය සභාව වැඩිදුරටත් යෝජනා කරන්නීය.

EOG 06 - 0135/3

---

**දකුණු පළාතේ පළාත් සභාව**

වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව

**විනෝද බදු පැනවීම**

***1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි***

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු (267 වන අධිකාරය වන) 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියෙන් වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.11.03 දින අංක 171 යටතේ ගෙන ඇති පහත සඳහන් තීරණය 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (2) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව දකුණු පළාත් ආණ්ඩුකාරවර ආචාර්ය විලියම් විජේසිංහ ගමගේ වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් කාරුණිකව නිවේදනය කරනු ලැබේ.

ආචාර්ය **විලියම් විජේසිංහ ගමගේ,**
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2024 මාර්තු මස 15 වැනි දින,
ගාල්ල ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

*තීරණය*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු (267 වන අධිකාරය වන) 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියෙන් වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශයන්හි පවත්වනු ලබන ඉහත කී විනෝද බදු ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට කරනු ලබන ගෙවීමකින් 10% (සියයට දහයක) ට සමාන මුදලක් බද්දක් වශයෙන් පනවා අය කිරීමටත්, මෙම *තීරණය ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු බවටත්, තීරණය කරමි. තව ද, ඉහතින් පනවන ලද විනෝද බද්ද එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර අදාළ සංවිධායක හෝ සංවිධායකවරුන් හෝ විසින් නිසි ලෙස වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට ද තීරණය කරමි.

EOG 06 - 0135/4

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.